# සාමාන්‍ය සමයේ විසිඅටවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**රෝම 3 : 21 – 30**

දේව සබඳතාවට පමුණුවනු ලබන්නේ ඇදහිල්ල මගින් ය.

දැන් මිනිසුන් දේව සබඳතාවට පමුණුවාලීම පිළිබඳ දෙවියන් වහන්සේගේ ක්‍රියා මාර්ගය එළිදරව් වී තිබේ. ව්‍යවස්ථාව හා දිවැසාවලිය ඊට සාක්ෂි දුන් නමුත් එය කිසිසේත් ව්‍යවස්ථාව පිට රඳා නැත. ඒ වනාහි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන අදහන සියල්ලන් දෙවියන් වහන්සේ විසින් තමන් වහන්සේ සමග සබඳතාවට පමුණුවනු ලැබීමේ මාර්ගය වේ. එය කිසි වෙනසක් නැතිව අදහන්නා වූ හැම දෙනාට ම ලබා ගත හැකි ය. සියල්ලෝම පව් කොට දෙවියන් වහන්සේගේ ගැළවීමේ මාර්ගයෙන් ඉවත් වී සිටිති.

දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ අත්කර දුන් ගැළවීම කරණකොටගෙන සියල්ලෝ ම නොමිලයේ දේව සබඳතාවට පත්කරනු ලැබ සිටිති. ඇදහිල්ලෙන් පව් කමාව ලබනු සඳහා, ක්‍රිස්තුස් වහන්සේ ස්වකීය මරණයෙන් පව් නසන පූජාවක් වීමට දෙවියන් වහන්සේ නියම කළ සේක. එසේ කළේ උන් වහන්සේගේ සාධාරණකම පෙන්වන පිණිස ය. පෙර කාලවල උන් වහන්සේගේ ඉවසීමෙන්, මිනිසුන්ගේ පව් ගණන් නොගෙන හැරිය සේක.

එහෙත් මේ කාලයේ දී උන් වහන්සේ සාධාරණකම පෙන්වන පිණිස මිනිසුන්ගේ පව් සලකා බලන සේක. දෙවියන් වහන්සේ මෙලෙස කිරීමෙන් උන් වහන්සේ සාධාරණ බවත්, ක්‍රිස්තුස් වහන්සේ අදහන කවරෙකු වුවත් දේව සබඳතාවට පමුණුවන බවත් පෙන්වන සේක. එසේ නම්, අපට පුරසාරම් දෙඩීමට ඉඩක් ඇද්ද? කොහෙත්ම නැත. එසේ කියන්නේ කුමන ප්‍රතිපත්තියක් අනුව ද? ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රතිපත්තිය අනුව ද ? එසේ නොව ඇදහීමේ ප්‍රතිපත්තිය අනුව ය. මන්ද, මනුෂ්‍යයෙකු දේව සබඳතාවට

පමුණුවනු ලබන්නේ ව්‍යවස්ථාවේ නියමයන් පිළිපැදීමෙන් නොව, ඇදහිල්ලෙන් පමණක් බව අපි නිගමනය කරමු. දෙවියන් වහන්සේ ජුදෙව්වරුන්ගේ දෙවියන් වහන්සේ පමණක් ද? විජාතීන්ගේත් දෙවියන් වහන්සේ නොවන සේක් ද? එසේය, විජාතීන්ගේත් දෙවියන් වහන්සේ ය. මන්ද, වැඩ සිටින්නේ එකම දෙවියන් වහන්සේ ය. උන් වහන්සේ චර්මඡේදිතයන් ඔවුන්ගේ ඇදහීම නිසාත්, එසේම අචර්මඡේදිතයන් ඔවුන්ගේ ඇදහීම නිසාත් දේව සබඳතාවට පමුණුවන සේක.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 130 : 1-5

පිළිතුර: අපගේ ගැළවීම මුළුමනින් ම සමිඳුන් කෙරෙහි ය.

ගීය:

සමිඳුනි, දුක් සයුරේ සිට මම ඔබට මොර ගසමි.
සමිඳුනි, මාගේ හඬට සවන් දුන මැනව.
මාගේ කන්නලව්වට ඔබේ කන් යොමු කළ මැනව.

සමිඳුනි, ඔබ අපේ අයුතුකම් සටහන් කර තබන සේක් නම්, විනිශ්චයයෙන් බේරෙන්නට පුළුවන් කවරෙකුට ද?
එහෙත්, ඔබ කෙරෙහි ගරු බියෙන් සිටින පිණිස ඔබ අපට කමාව දෙන සේක.

මම සමිඳුන්ගේ උපකාරය උදක් ම බලා සිටිමි. එතුමන්ගේ වචනය කෙරෙහි බලාපොරොත්තුව තබමි.
පහන් වනතුරු බලා සිටින මුරකරුවන්ට වඩා, එසේය, එළිය වැටෙන තුරු බලා සිටින මුරකරුවන්ට වඩා මම සමිඳුන් එනතුරු බලා සිටිමි.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ පණත් සියල්ල විශ්වාසී ය.
ඒවා සදහට ම පවතිනු ඇත්තේය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.
මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය”යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 11: 47-54

"සියලු දිවැසිවරයන්ගේ ලේ ගැන මේ පරම්පරාව වගකිව යුතුය."

"ඔබට වන විපතක මහත! ඔබගේ පියවරුන් අතින් මැරුම් කෑ දිවැසිවරයන්ගේ සොහොන් කොත් ඔබ ගොඩනගන්නහු ය. එසේ කිරීමෙන් ඔබගේ පියවරුන්ගේ ඒ ක්‍රියා ඔබ අනුමත කරන බව සහතික කරන්නාහු ය. ඔව්හු ඔවුන් මැරූහ. ඔබ ඔවුන්ගේ සොහොන් කොත් ගොඩ නගන්නාහු ය. එහෙයින් දෙවියන් වහන්සේගේ ප්‍රඥාව පවසන ලෙස දිවැසිවරයන් ද අපෝස්තුළුවරුන් ද ඔවුන් වෙත යවන්නෙමි. මනුෂ්‍යයෝ ඔවුන්ගෙන් ඇතැමෙකුට තළා පෙළා ඇතැමෙකු මරා දමති. මෙසේ ආබෙල්ගේ මරණයේ පටන් පූජාසනය හා ශුද්ධ ස්ථානය අතර මරන ලද සෙකරියස්ගේ මරණය දක්වා ලෝකය මැවීමේ සිට වගුරුවන ලද සියලුම දිවැසිවරයන්ගේ ලේ ගැන මේ පරම්පරාව වගකිව යුතුය. එසේය. මේ පරම්පරාව ඒ ගැන වගකිව යුතු යැ යි මම ඔබට කියමි. විනයධරයෙනි, ඔබට වන විපතක මහත විද්‍යාවේ යතුරු ඔබ ගෙන ගියාහු ය. එහෙත් ඔබම ඇතුළු නොවූවහුය. ඇතුළුවන්නන් ද වළක්වා ලූවහුය."

උන්වහන්සේ එතැනින් ආ කල්හි විනයධරයෝ ද පරිසිවරු ද උන්වහන්සේ කට වචනයෙන් අල්ලා ගනු වස් මාන බලමින් බොහෝ දේ ගැන විවාදයට පොළඹවනු පිණිස උන්වහන්සේ අවුස්සා ලීමට පටන් ගත්හ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.